26

ජාතීන් අතර සහජීවනය ගොඩනැගීම

සෙනෙහස, සහෝදරත්වය, ඉවසීම, ජාතීන් අතර සහයෝගීතාව යනාදී මිනිස් සබඳතාවන් තර කරන ගුණාංගයන්ගෙන් බැඳී තිබීම ජනයා අතර සමෘද්ධිය ඇති කිරීමට අවස්ථාවක් වන්නේ ය. ඉස්ලාම් දහම මෙය පිළිගන්නා අතර එහි වැදගත්කම ගැන දේශනාවන් ද කර ඇත. සාමකාමී ලෙස ජීවිතය ගත කිරීමට බල කරන ඉස්ලාම් ධර්මය, මිනිසා එකිනෙකා දැන හඳුනාගෙන ජීවත් වීමට මගපෙන්වන්නේ ය.

සමාජයන් අතර සාධාරණත්වය පිළිපැදීම

ජාති, භාෂා, ප්‍රදේශ යනාදී සීමාවන් ඉක්මවා විවිධ ආගම්, සංස්කෘති අනුගමනය කරන ජනයා සමග සාමයෙන් ජීවත් වීමට ශුද්ධ වූ අල්කුර්ආනය මග පෙන්වා ඇත. මෙය ළඟා කර ගැනීමට වැදගත් සාධකයක් ලෙස සාධාරණත්වයෙන් කටයුතු කිරීමට බල කර ඇත. ජනයා අතර සාධාරණත්වයෙන් කටයුතු කිරීම දේව භක්තියට සම කළ හැකි බව අල්කුර්ආනය පැහැදිලි කරයි. එක් සමාජයක් හෝ කණ්ඩායමක් වෙත කෙනෙකු හෝ කණ්ඩායමක් දරන කැමැත්ත හෝ අකමැත්ත මත යුක්තිය ඉදිරියේ බලපෑම් නොකළ යුතු යැයි අල්කුර්ආනය අවධාරණය කරයි. **“ඊමාන්ධාරිනී, ඔබ නීතිගරුක වී අල්ලාහ් හමුවේ සාක්කිකරුවන් වන්න. ඔබ දක්වන යුක්තිය ඔබට හෝ ඔබගේ දෙමාපියන්ට හෝ ළඟ ම නෑදෑයකුට හෝ විරුද්ධ වුව ද කම් නැත.”** (අන්නිසා : 35)

නබි සල්ලල්ලාහු අලෛහි වසල්ලම් තුමාණෝ මදීනාවේ පාලනය ස්ථාපනය කරන විට එහි සිදු වූ සිදුවීම්, ජාතීන් අතර සුහදතාව රැකගැනීමේ කටයුත්තෙහි ආදර්ශයක් විය. මුස්ලිම්වරු මක්කාවේ සුළු ජාතිකයන් ලෙස ජීවත් වූ විට කුරෛෂිවරුන්ගේ තාඩන පීඩන විඳ දරාගෙන හා මදීනාවේ මහජාතීන් ලෙස ජීවත් වූ විට සුළු ජාතීන්ගේ අයිතිවාසිකම්වලට ගරු කරමින් ජීවත් වූ බවට ඉතිහාසය සාක්කි දරයි. නබි සල්ලල්ලාහු අලෛහි වසල්ලම් තුමාණන්ට පසුව සහාබාවරුන්ගේ හා තාබිඊන්වරුන්ගේ කාලවල දී මෙය ආදර්ශයක් ලෙස පැවතුණි.

ගිවිසුම් මඟින් අයිතීන් රැක ගැනීම

මදීනාවේ ජීවත් වූ යුදෙව්වෝ නිතර ම ඉස්ලාමයට හා නබි සල්ලල්ලාහු අලෛහි වසල්ලම් තුමාණන්ට විරුද්ධව ක්‍රියා කළ අය වූහ. ඔවුහු කටකතා පතුරවා හැර, මුස්ලිම්වරුන්ට එරෙහිව මුෂ්රික්වරුන් උසි ගැන්නුවෝ ය; මුස්ලිම්වරුන්ගේ සහෝදරත්වය විනාශ කිරීමට උත්සාහ කළෝ ය. මොවුන්ගෙන් නිතර ම ඉස්ලාමයට අනතුරු බහුල විය. එනමුත් නබි සල්ලල්ලාහු අලෛහි වසල්ලම් තුමාණෝ මදීනාවේ පාලනය බාරගත්හ. එම අවස්ථාවේ දී නබි සල්ලල්ලාහු අලෛහි වසල්ලම් තුමාණෝ එම යුදෙව්වන් සමඟ සුහදව ක්‍රියා කළහ. නබි සල්ලල්ලාහු අලෛහි වසල්ලම් තුමාණන් පාලනය කළ මදීනා ප්‍රදේශයේ යුදෙව්වෝ නජ්රාන් දේශයේ සිටියහ. එහි සියලු ම ආගමිකයින්ට සියලු ආකාරයේ අයිතීන් දී තිබුණි. ඔවුන් අතර ගිවිසුම් කිහිපයක් ද තිබුණි. ක්‍රි. ව. 622 දී මදීනා ගිවිසුමේ ඇති සමහරක් අයිතීන් ලබා දෙන ලදී.

- ගිවිසුම් ඇති කරගත් යුදෙව්වන් අපේ ආරක්ෂාවට අයිති වූවන් ය. ඔවුන්ට සියලු ම අයිතීන් ඇත. ඔවුන්ට අයුක්තියක් නොකරමු. ඔවුන්ගේ සතුරන්ට උදවු නොකරමු.
- යුදෙව්වන් ඔවුන්ගේ ආගමට අනුව ජීවත් වෙති. විවාහය, දික්කසාදය, දේපල උරුමකම්, වස්තු බෙදීම යනාදී කටයුතුවල දී යුදෙව්වන්ගේ ආගමේ නීතිරීති අනුව විසඳුම් දීමට හැකි ය.

ක්‍රි. ව. 630 නජ්රාන් රටේ ක්‍රිස්තියානිවරුන් සමඟ ඇති කරගත් ගිවිසුමෙහි

- නජ්රාන් හා එය අවට ප්‍රදේශවල ජීවත් වන වැසියන්ගේ ප්‍රාණය, වස්තු, භූමිය, වෙළෙඳාම, ආගම වැඳුම් කරන පිළිම යනාදී සියල්ල ම දෙවියන්ගේ හා දේව දූතයාගේ ආරක්ෂාව යටතේ තිබේ.
- ඔවුන්ගේ දැනට පවතින තත්වයෙහි කිසි දු වෙනසක් සිදු නොකෙරේ, ඔවුන්ගේ අයිතිය පැහැර ගන්නේ නැත. කිසි දු පූජකවරයකු දේවාලයේ භාරකාරත්වයෙන් හා තනතුරුවලින් ඉවත් කරන්නේ ද නැත.

ඉහත දැක්වූ ගිවිසුම් දෙක ම නබි සල්ලල්ලාහු අලෛහි වසල්ලම් තුමා අනෙක් සමාජයන් සමඟ සුහදව කටයුතු කිරීම විදහා පාන්නේ ය. නබි සල්ලල්ලාහු අලෛහි වසල්ලම් තුමාණන්ගේ කාලයේ සේ ම සහාබාවරුන්ගේ කාලයේ දීත් ජාතීන් අතර සුහදතාව රැකුණේ ය.

වරක් උමර් රළියල්ලලාහු අන්හු තුමාණෝ මුස්ලිම් නොවන පුද්ගලයකුගෙන් අශ්වයකු මිලට ගත්හ. එම අශ්වයා පිට නැග ටික දුරක් යනවිට උගේ යම්කිසි අඩුවක් තිබෙන බව දැනගත් එතුමා විකුණූ තැනැත්තා වෙත පැමිණ නැවත ඌ භාරගන්නා ලෙස කී විට ඔහු එයට එකහෙළා ම විරුද්ධ විය. දෙදෙනා ම ෂුරයිහ් නම් විනිසුරුතුමා වෙත ගියෝ ය. නඩුව හොඳින් තේරුම්ගත් 'කාලිතුමා' "භාණ්ඩයක් විකුණූ පසුව දෙදෙනා ම එම ස්ථානයෙන් ඉවත් වීමට පෙර එය නැවත භාර දීමේ අයිතිය ගැනුම්කරුවාට තිබෙන නමුත් එම ස්ථානයෙන් දෙදෙනා ම ඉවත් වුවායින් පසු එය භාර නොගැනීමේ අයිතිය විකුණුම්කරුවාට තිබෙන බව" කියා එතුමා නඩුව අවසන් කළේ ය. එම තීන්දුවෙන් ඉතා සතුටට පත් වූ කලීෆා උමර් රළියල්ලාහු අන්හු තුමා 'කාලි' තුමාගේ තනතුර උසස් කොට 'කුබා' වෙහි 'කාලිවරයා' ලෙස ඔහු පත් කළේ ය.

ආගම්වලට තිබෙන අයිතිවාසිකම්

සෑම මිනිසෙකුට ම තමා කැමති ප්‍රතිපත්තිය හෝ ආගම අනුගමනය කිරීමේ නිදහස තිබේ. මෙම වෙනස් වූ ප්‍රතිපත්ති හෝ ආගම් අනුගමනය කරන්නන් එකිනෙකාට සතුරන් නොවන බවත්, එලෙස ම කෙනෙකු පිළිගත් ආගම හෝ ප්‍රතිපත්තිය වෙනත් කෙනෙකුට පිළිගැනීමට බල කිරීමේ අයිතියක් නොමැති බවත් පෙන්වන්නේ ය.

"ආගම් විෂයෙහි බල කිරීමක් නොමැත." (2 : 256)

"ඔබට ඔබගේ මාර්ගය, මා හට මාගේ මාර්ගය, ඔබ ඔබගේ ආගම අනුගමනය කරන්න. මම මගේ ආගම අනුගමනය කරන්නෙමි." (109 : 6)

ඔවුන් විශ්වාස නොකළා යැයි ඔවුන් වෙත කිසිදු ආධිපත්‍යයක් කළ නොහැකි ය. **"ඔවුන් වෙත ආධිපත්‍යය පතුරවන්නෙකු ලෙස ඔබ නැත."** (88 : 22) යැයි අල්කුර්ආන් පවසන්නේ ය.

මෙවන් වාක්‍යයන් අධික වශයෙන් අල්කුර්ආනයේ දක්නට ඇත.

ක්‍රිස්තියානිවරුන් බහුලවශයෙන් විසූ පලස්තීනයේ පාලනය භාරගැනීමට ගිය කලීෆා උමර් රළියල්ලාහු අන්හු තුමාණෝ සලාතයෙහි නියමිත වෙලාව පැමිණ විට කිතුනු පල්ලියක සිටියහ. එම පල්ලිය භාර පූජකතුමා කලීෆා වෙත පැමිණ පල්ලිය තුල සලාතය ඉටු කරන ලෙස ඉල්ලූ විට, එය ප්‍රතික්ෂේප කළ කලීෆා තුමා පසු කාලයේ දී කෙනෙකු මෙහි මම සලාතය ඉටු කළ හේතුවෙන් මෙය මස්ජිදයක් කරන්නට පුළුවනි'' යැයි පවසා දේවාලයෙන් පිටත එතුමාගේ සළුව දමා සලාතය ඉටු කළේ ය.

අනුන්ගේ හැඟීම්වලට ගරු කිරීම

යුදෙව්වකුගේ අවමඟුල් පෙරහැර පාරේ ගමන් කරන විට නබි සල්ලල්ලාහු අලෛහි වසල්ලම් තුමාණෝ නැගී සිටියහ. "එය යුදෙව්වකුගේ මිනිය" යැයි කී විට නබි සල්ලල්ලාහු අලෛහි වසල්ලම් තුමාණෝ "එයත් ආත්මයක් (ජීවිතයක්) නොවේ ද" යනුවෙන් පැහැදිලි කළහ. (බුහාරි, මුස්ලිම්)

උදවු උපකාර කිරීම

නබි සල්ලල්ලාහු අලෛහි වසල්ලම් තුමාණෝ මක්කාවෙන් පිට වී මදීනාවේ ජීවත් වන කාලයේ මක්කා වාසීන් සාගතය හේතුවෙන් කුසගින්නෙන් පීඩා විඳින බව ආරංචි වී, වහා ම හාතිබ් බින් අබී බල්තආ යන මිතුරාට දිර්හම් 500ක් දී මක්කාවේ ජීවත් වන කුරෛෂි කාෆිර්වරුන්ට අවශ්‍ය දේවල් මිලට ගෙන දෙන ලෙස කීවෝ ය. මීට අමතරව මක්කාවේ මුස්ලිම්වරුන් වධහිංසාවලට ලක් වූ විට ඔවුන්ගෙන් සමහර අය නබි සල්ලල්ලාහු අලෛහි වසල්ලම් තුමාණන් ඇබීසීනියාවේ ක්‍රිස්තියානි රජතුමා වන නජ්ජාෂි වෙත ආරක්ෂා සහිතව යැව්වේ ය. මදීනාවේ ක්‍රිස්තියානි දූත පිරිසකට මස්ජිදයට ම කැඳවා සංග්‍රහ කළෝ ය. මදීනාවේ සිටින යුදෙව්වන් සමඟ ඇසුරක් තබාගත් නබි සල්ලල්ලාහු අලෛහි වසල්ලම් තුමාණෝ හදිසි අවස්ථාවලදී ඔවුන් සමඟ ණය ගනුදෙනු ද සිදු කළහ.

සහජීවනය ගොඩනැගීමට අදාළ මගපෙන්වීම්

- මිනිසුන් සියලු දෙනා ආදම් අලෛහිස්සලාම් තුමාගේ පරම්පරාවෙන් පැවත එන්නන් යැයි පිළිගැනීම.
- අසල්වැසියන් සමඟ සුහද ඇසුරක් තබා ගැනීම.
- වරදක් සිදු වන අවස්ථාවල දී සමාව දීම, සමාව ඉල්ලීම යනාදී වශයෙන් මහන්තත්වයෙන් තොරව කටයුතු කිරීම.
- පොදු සිදුවීම්, උත්සව අවස්ථාවල ඒවාට සහභාගීවීම, අන්‍යෝන්‍ය වශයෙන් උපකාර කිරීම.
- හදිසි අවස්ථාවලදී, අවශ්‍යතා ඇති වූ විට උදවු කරගැනීම, ප්‍රාදේශීය, ජාතික වශයෙන් යහපත් කටයුතුවල දී සහභාගීවීම.
- ජාතික සුහදතාව ඇති කිරීමේ සාකච්ඡා, රැස්වීම් යනාදී වැඩසටහන් සංවිධානය කිරීම හා ඒවාට සහභාගීවීම.
- අකීකා, ඉබාදා, හලාල්, හරාම් යනාදී කටයුතුවල දී අනුන්ගේ සිත්වල ජාති ආගම් විරෝධතා මතු නොවන ලෙස කටයුතු කිරීම.
- කතාවෙන් හෝ ක්‍රියාවෙන් අනෙක් ආගමික සංස්කෘතීන්ට අයත් ජනයා අපහසුතාවට පත් කිරීමෙන් වැළකීම.

අභ්‍යාස

1. ජාතීන් අතර සහජීවනය සුරැකීමෙහි ලා මදීනා ගිවිසුමේ දායකත්වය දක්වන්න.
2. නබි සල්ලල්ලාහු අලෛහි වසල්ලම් තුමාණන් සහෝදර ආගමිකයන්ගේ හැඟීම්වලට ගරුකරමින් කටයුතු කළ බවට උදාහරණයක් ලියන්න.
3. සහාබාවරුන්ගේ යුගයේ ජාතික සහජීවනය සඳහා සිදුවූ සිද්ධියක් දක්වන්න.